# අර්ථ විවරණය සංක්ෂිප්ත කොට දැක්වීමට දීඝනිකාය ටීකාවෙහි භාවිත ක්‍රමවේද හැඳින ගැනීම

## ග්‍රන්ථනාමය හා කර්තෘ

සුමංගලවිලාසිනි නාම දීඝනිකායට්ඨකථාය ලිනත්ථප්පකාසනා දීඝනිකායටීකා[1] යනු මෙහි ග්‍රන්ථ නාමය යි. එහි අර්ථය සුමංගලවිලාසිනී නම් දීඝනිකාය අට්ඨකථාවෙහි සැඟවුණු අර්ථ ප්‍රකාශිත දීඝනිකාය ටීකා යනු යි. සුමංගලවිලාසිනි යනු දීඝනිකාය අට්ඨකථාව යි. එම අටුවාවෙහි සැගවුණු අර්ථ ප්‍රකාශනයට රචිත කෘතිය දීඝනිකාය ටීකාව යි. අට්ඨකථාව **අත්ථවණ්ණනා**[2] යැයි ද ටීකාව ලිනත්ථවණ්ණනා යැයි ද හැඳින්වේ. **අත්ථ** හා **ලීනත්ථ** යන පාලි ප්‍රයෝග දෙකෙහි වෙනස ලීන යන්න යි. මෙහි ලීන යනු ලී- සිලෙසනෙ සැඟවීමෙහි[3] දිවාදී ගණික ධාතුවෙන් නිපන් පදයකි. ලීන හා අත්ථ යන පද සන්ධි වීමෙන් ලීනත්ථ වී, සැගවුණු අර්ථය, ගුප්තාර්ථය හා දුෂ්කරාර්ථය[4] යැයි ඊට අර්ථ දක්වා තිබේ.

මෙහි කතුවරයා කවරෙක් දැයි විමර්ශනයේ දී දීඝනිකාය ටීකා නිගමන කථා වණ්ණනාවෙහි එන දීඝනිකාය ටීකා රචිතාචරිය ධම්මපාලෙන[5] යන්න වැදගත් වේ. ආචාර්ය ධම්මපාල තෙරුන් විසින් රචනා කරන ලද බව එයින් ප්‍රකාශ වේ. මේ ගැන විමර්ශනය කළ පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ ද[6] දීඝනිකාය ටීකාව ආචාර්ය ධම්මපාලයන් විසින් විරචිත යැයි දක්වති. ආචාර්ය, හරතසිංහ උපාධ්‍යායගේ[7] අදහස වන්නේ ධම්මපාල යනු තමිල ප්‍රදේශයේ කාඤ්චිපුරයේ උපන් සිංහල මහා විහාරයේ අධ්‍යාපනය ලැබූ පසුව දමිල ප්‍රදේශයේ බදරතිත්ථ නම් විහාරයට ගොස් එහි වාසය කළ බුද්ධඝොස, බුද්ධදත්ත තෙරවරුන්ට සමකාලීන ව විසූ අටුවා ඇදුරු බව යි. උක්ත කරුණ සියුම් ලෙස විමර්ශනය කළයුතු වුවත් මෙහිලා ඊට අවකාස නොවේ.

## අර්ථසංවර්ණනා ක්‍රම

අට්ඨකථාචාර්ය, බදරතිත්ථවාසී ධම්මපාල තෙරණුවෝ ධර්මාර්ථ සංවර්ණනා ක්‍රම සයක්[8] දක්වති. එනම්, සම්බන්ධය දැක්වීමෙන් , පද වශයෙන්, පද විභාග දැක්වීමෙන්, අර්ථ වශයෙන් ,ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් හා පිළිතුරු සැපයීමෙන් යනු යි. දීඝනිකාය අභිනව ටීකාචාර්ය තුමා ද අර්ථ සංවර්ණනයේ අංග පහක්[9] පෙන්වා දෙයි. එනම්, ව්‍යඤ්ජනාර්ථය , පදගතාර්ථය, නිදානය, වස්තුව

---

[1] දීඝනිකාය ටීකා, 737 පි.

[2] සුමංගලවිලාසිනී දීඝනිකායට්ඨ කථා, විඤ්ඤාපනය 1 පි.

[3] පාලි සිංහල ශබ්දකෝෂය, 433 පි.

[4] එම.

[5] දීඝනිකායටීකා, 749 පි.

[6] පාලි සාහිත්‍ය , 242 පි.

[7] පාලි සාහිත්‍යයේ ඉතිහාසය, 443 පි.

අථවජහි ආකාරෙහි සංවණ්ණනා කාතබ්බා. සම්බන්ධතො පදතො පදවිභාගතො අත්ථතො අනුයොගතො පරිහාරතො චාති.

[8] දීඝනිකාය ටීකා, 25 පි.